# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 153 — 1975 පෙබරවාරි 28 වැනි සිකුරාදා — 1975.02.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 149 | ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| කනතුරු—ඇබෑර්තු ... ... ... | 150 | අය-වැය ලේඛන ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 154 | දේපල විකිණීම ... ... ... | 155 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම ... ... ... | 157 |


සැ. යු.—(i) ණය සහන සහා පනත් කෙටුම් පත සහ ණය බේරුම් කිරීමේ පනත් කෙටුම් පත 1975 පෙබරවාරි 21 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී. ii ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 6 දරන සේවක අර්ථ සාධක අරමුදල් (විශේෂ විධිවිධාන) පනත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 7 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත 1975 පෙබරවාරි 28 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ.

## පළාත් පාලන නිවේදන

### විශේෂ කොමසාරිස් කාර්යාලය—ධර්ගානගරය

#### සුළු නගර සභා ආඥාපනත

#### 1975 වර්ෂය සඳහා වූ විශේෂ කසල ශෝධන බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129(ආ) වැනි වගන්තිය යටතේ ධර්ගානගරයේ විශේෂ කොමසාරිස් විසින්, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව ධර්ගානගරය තුළ පිහිටා ඇති සියලුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට දෙක බැගින් වූ විශේෂ කසල ශෝධන බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හිදී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් විසින් දෙන ලද අනුමැතිය ඇතිව 1975 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ජී. වී. එස්. ද අල්විස්,
පළාත් පාලන කොමසාරිස්.

1975. 02. 11 දින,
කොළඹ දී ය.

2-742–75.02.28 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

---

### උතුරු ඕතර පළාත ගම්සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වන අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 71 (1) දරන උපවගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරි තැනවූද, උතුරු ඕතර පළාත ගම් සභාවේ සභාපති තැනවූද, ඇම්. ඇම්. ඒ. රත්නසේන වන මම; 1975 වර්ෂයේදී පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දිනවලදී උතුරු ඕතර පළාත ගම්සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

---

### සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. ෂී. ෂිරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

උපලේඛනය

1975 ජනවාරි මස 27 දින (පසළොස්වක පෝය)
1975 පෙබරවාරි මස 25 දින (පසළොස්වක පෝය)
1975 මාර්තු මස 26 දින (පසළොස්වක පෝය)
1975 අප්‍රේල් මස 25 දින (පසළොස්වක පෝය)
1975 මැයි මස 24 දින (පසළොස්වක පෝය)
1975 මැයි මස 25 දින (වෙසක් පොහෝ දිනට පසු දින)
1975 ජූනි මස 23 දින (පසළොස්වක පෝය)
1975 ජූලි මස 22 දින (පසළොස්වක පෝය)
1975 අගෝස්තු මස 21 දින (පසළොස්වක පෝය)
1975 සැප්තැම්බර් මස 19 දින (පසළොස්වක පෝය)
1975 ඔක්තෝබර් මස 04 දින (ලෝක සත්ව දිනය)
1975 ඔක්තෝබර් මස 19 දින (පසළොස්වක පෝය)
1975 නොවැම්බර් 18 දින (පසළොස්වක පෝය)
1975 දෙසැම්බර් මස 18 දින (පසළොස්වක පෝය)

ඇම්. ඇම්. ඒ. රත්නසේන,
සභාපති,
උතුරු මිතර පළාත ගම්සභාව.

1975 පෙබරවාරි මස 12 දින,
උතුරු මිතර පළාත ගම්සභා කාර්යාලයේදීය.

2–766—75.02.28 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

# තනතුරු—ඇබෑර්තු

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළකෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි

1. දීමනා.—රජයේ නිලධාරීන්ට අදළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසි වලටත් යටත් වෙයි.

3. සේවය භාරගැනීම පිළිබඳ කොන්දේසි.—(අ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරුවලට පත්කරනු ලබන සියලු දෙනාම පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ඇත. මෙම අරමුදලට සේවකයා විසින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් සියයට 6 ක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. අදළ නිලධාරිතැනගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට 9 ක් ඔහු සේවය කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඔහු වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිළධාරීන්, ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වන වගන්තිය යටතේ සේවයෙන් මුදහරිනු ලැබ, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකරනු ලැබුවහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ. පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිළධාරියෙකු එම සේවයේ විශ්‍රාම වැටුප් සහිත වෙනත් තනතුරකට පත්කරන ලද්දේ නම් හෝ උසස් කරන ලද්දේ නම් ඔහු සිය නව තනතුරෙහිද විශ්‍රාම වැටුප් හිමිකම් තවදුරටත් භුක්ති විඳිනු ඇත.

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට කලින් ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඈ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරුවලට පත්කරනු ලබන නිළධාරීන්ට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය අදළ නොවනු ඇත. එහෙත් ස්ත්‍රීන්ද, වයස අවුරුදු 55ට වැඩි නිළධාරීන්ද, පළාත් පාලන සේවයට පත්කරන ලද දිනයට පෙර, ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිළධාරීන්ද හැර, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සිට වෙනත් විශ්‍රාම වැටුප් සහිත තනතුරකට උසස් කරන හෝ පත්කරන ලද සියලු දෙනාටම 1952 ජූනි 30 වන දින හා 10,329 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය අනුමාන මූලික වැටුපෙන් සියයට 4ක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඒ ඒ නිළධාරියාගේ අනුමාන මූලික වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඉ) ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියමකළ හැකිය.

(ඊ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(උ) අන්‍යාකාරයකින් නියමකොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම් අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(ඌ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

(එ) පත්කරනු ලබන අය දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කළ යුතුය.

4. පළාත් පාලන සේවයට නව ප්‍රවේශක නිලධාරීහු.—(i) අදළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියමකොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දනට පවත්නාවූත් හෝ මින්මතු සම්පාදනය කළ හැකි වූ කිසියම් නියෝග හෝ නීතිරීති වලට එකඟවීමේ කොන්දේසියට සියළුම නව ප්‍රවේශක නිළධාරීන් එකඟ විය යුතුය.

(iii) රාජකාරී කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීමෙහිලා අත්‍යවශ්‍ය නොවන්නාවූ විශේෂ අවස්ථාවන්හිදී හැර, ඔවුන් ස්වකීය ආධුනික/වැඩ පරීක්ෂණ කාලපරිච්ඡේදය ඇතුළත රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමේ දැනුමක් ලබාගත යුතුය.

(iv) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, නියමිත කාලසීමාව තුළදී කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයට වඩා ඉහළ නොවන මට්ටමක් දක්වා වූ සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමා ඇතුළත දී මෙම පරීක්ෂණවලින් අසමත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එසේ නියමිත පරීක්ෂණවලින් සමත්වනතුරු නියමිත වැටුප් වැඩිවීම් නොගෙවනු ලබන අතර, ස්වකීය ආධුනික කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසාන වනවිට, සිංහල ප්‍රවීනතාවය පිළිබඳ නියමිත තත්ත්වය ලබාගැනීමට අසමත්වන නිලධාරීන්ගේ සේවය අවසන් කරනු ලැබිය හැකිය.

(v) අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථය අඩුම සුදුසුකම වශයෙන් නියමකොට ඇත්තා වූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සම්මානයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියාවූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිළධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදළ නොවේ.)

සටහන.—(i) පළාත් පාලන සේවයට ඇතුලුවීම් සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා අය තනතුර ස්ථිර කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් වූ සිංහල ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමෙන් නිදහස් කරනු ලැබේ.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශක" යන පදය අදළ් වනුයේ 1960.1.29 දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදන අනුව පළාත් පාලන සේවයේ තනතුරුවලට පළමුවරට පත්කරනු ලබන නිලධාරීන්ටය.

(iii) රජයේ සේවයෙහි නියැළිව සිට, පළාත් පාලන සේවයේ තනතුරු භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ "ආදී ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ජේදයේ (iii) හා (iv) දරණ ජේදවල සඳහන් විධිවිධාන අදාළ නොවේ.

5. සෑම අයදුම්කරුවෙකු විසින්ම, තමා ලාංකිකයකු බවට සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. "ලාංකිකයා" යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවාමුක්ත වූ අයදුම් කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම්, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවාමුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධ යෙන් පළකෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිළධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ග යෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම් පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරු වලින් මුදවන්නට තමන් සූදානම්ව සිටිද්ද නැද්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක්, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබාගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවෙකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒබව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැතිවූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

### අන්‍යාකාරයකින් සඳහන්කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ.පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ජේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

### ...............තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩු ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————
(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————
ජාතිය :————

(ඔබ ලියාපදිංචි වීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදැහුම් අංකයත් සඳහන් කරන්න).

3. තැපැල් ලිපිනය :————
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි).

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු :———— මාස :———— දින :————

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරු :————
(ආ) අයදුම්කරුගේ පියා :————
(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————
(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුය. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ආ) සහ (ඈ) පිරවිය යුතුය).

6. විවාහක ද ? අවිවාහක ද ? වැන්දඹු ද ? :————

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ) :—

| | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|---|
| පළමුවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ)—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම් :—

| විභාගයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය ;—

(i) සිංහල :————

(ii) දෙමළ :————

(iii) ඉංග්‍රීසි :————

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————

10. වෘත්තීය/කාර්මික/කාර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතික වල පිටපත් ඇමිණිය යුතුයි).

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාලසීමාවන් :————

(ඈ) දැනට කරන රක්ෂාව —පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රෙණිය හා ඊට පත්වූ දිනය :————

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————

(ඉ) සේවාමුක්ත භටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————

12. කියවීම, ලිවීම, කථාකිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතා වක් ඇද්ද :—

(අ) සිංහල :————

(ආ) දෙමළ :————

13. විශෙෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළයුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————
අයදුම්කරුගේ අත්සන.

දිනය ;————

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.
තැ.පෙ. 530, කොළඹ 1.

---

### පළාත් පාලන සේවය

#### ගඟ පළාත ගම් සභාව—මුරකරු තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 540—30×8—24×1—රු. 804. රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩඉම් ඇත.

3. අවශ්‍ය සුදුසුකම් :

(අ) වයස 1975 මාර්තු මස 12 වෙනි දිනට අවුරුදු 22ට නොඅඩු 30ට නොවැඩි විය යුතුය.

(ආ) අපේක්ෂකයින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ සිංහල භාෂාවෙන් සහ වෙනත් විෂයයන් පහකින් ද, දෙවරකට වැඩි නොවන වාර ගණනකදී සාමාර්ථය ලබා තිබීම.

(ඇ) චරිතය විශිෂ්ඨ විය යුතුය.

4. පළාත් පාලන සේවා සාමාජිකයින්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩල වල ස්ථිර සේවයේ සිටින සේවකයින්ගේ අයදුම් පත්‍ර ඔවුන් අනෙකුත් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සළකා බලනු ලැබේ.

5. ඉල්ලුම්කරුවන් ගඟ පළාත ගම් සභා සීමාව තුළ පදිංචිකරුවන් විය යුතු අතර ඒ බව සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය උප දිසාපතිගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

6. මෙම ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරු වලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාල සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

7. ඉල්ලුම් පත්‍ර පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘතියට අනුව සාරානුකූලව පිළියෙල කර 1975 මාර්තු මස 12 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගඟ පළාත ගම් සභාවේ සභාපති වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

එච්. එම්. පී. බණ්ඩා,
සභාපති,
ගඟ පළාත ගම් සභාව.

1975 පෙබරවාරි මස 05 දින,
ගොනගත්තැන්න,
ගඟ පළාත ගම් සභා කාර්යාලයේ දී.

2–215—75.02.28 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

### හා. ප. පල්ලේගම්පහ දකුණ ගම් සභාව
### සහාය කම්බිකරු තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—සියළු දීමනා ඇතුළුව වර්ෂයකට රු. 2,154—8×54—රු. 2,586 යන වැටුප් ක්‍රමය. රු. 2,316 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමකි. තනතුර ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට යටත් වේ.

3. අවශ්‍ය සුදුසුකම්.—

(i) ලාංකිකයෙකු විය යුතුයි ;

(ii) 1975.3.21 දිනට වයස අවුරුදු 20ත් 30ත් අතර විය යුතුයි ;

(iii) අයදුම්කරු යටත් පිරිසෙයින් සිංහල කණිෂ්ඨය සමත් අය විය යුතුයි ;

(iv) අයදුම්කරුවන් ලංකා කාර්මික විද්‍යාලයේ විදුලිය කම්බි ඇදීම පිළිබඳ පාඨමාලාව හෝ විදුලි කම්බි ඇදීම පිළිබඳ කම්කරු දෙපාර්තමේන්තුව මගින් පැවැත්වූ පාඨමාලාව හෝ සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇති අය ;

හෝ

(v) පළාත් පාලන ආයතනයක, රජයේ හෝ විදුලි ආලෝක ව්‍යාපාරයන් හි යටත් පිරිසෙයින් අවුරුදු පහක සේවය කර පළපුරුද්දක් ඇතිව සිටිය යුතුයි.

(vi) IV ඡේදය යටතේ සුදුසුකම් ලබා අවුරුදු දෙකක පළපුරුද්දක් ඇති අය හා මෙම ගම් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචියක් ඇති අය කෙරෙහි විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත විය යුතුවාක් මෙන්ම දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් නොලැබුවකු විය යුතුයි.

5. පහත සඳහන් සහතික පත්වල පිටපත් අයදුම් පත සමඟ ඉදිරිපත් කළ යුතුයි :—

(i) අධ්‍යාපන සහතිකය ;

(ii) වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතිකය ;

(iii) උප්පැන්න සහතිකය ;

(iv) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් ;

(v) පදිංචිය හා චරිතය පිළිබඳ ග්‍රාමසේවක සහතිකය.

6. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ අයදුම් පතට අනුව සකස් කොට 75. 3. 21 දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් "සභාපති, හා.ප. පල්ලේගම්පහ දකුණ ගම්සභාව, වැකඩහදිරම, බටුගොඩ" යන ලිපිනයට එවිය යුතුයි.

පී. එන්. එම්. රෂීඩ්,
සභාපති,
හා. ප. පල්ලේගම්පහ දකුණ ගම් සභාව.

1975 ජනවාරි 31 වෙනි දින,
ගම් සභා කාර්යාලය, වැකඩහදිරම,
බටුගොඩ.

2-214–75.02.28 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

---

### පළාත් පාලන සේවය
### තක්සේරු පරීක්ෂක තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. වැටුප.—තනතුරට නියමිත වැටුප් ක්‍රමය, වර්ෂයකට රු. 4,152—144×17 සහ 180×8—රු. 8,640 වේ. මේ වැටුප් ක්‍රමයෙහි රු. 6,024 යන වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් ද, රු. 7,500 යන වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ද ඇත. මෙයට අමතරව, රජයේ නිලධාරීන්ට අදාළ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ජීවන වියදම් දීමනාවක් ද, විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

තෝරා ගන්නා ලද අයදුම්කරුවන් රු. 6,024 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉම් ඉක්මවීමට පළමු ලංකා කාර්මික විද්‍යාලයේ තක්සේරු ඩිප්ලෝමාවේ පළමු වැනි වෘත්තීය පරීක්ෂණයෙන් සමත් වීමට නියම කෙරේ.

3. අවශ්‍ය සුදුසුකම් :

(අ) 1975. 04. 15 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු, 30 ට නොවැඩි විය යුතුයි ;

(ආ) (i) අයදුම්කරුවන් ලංකා කාර්මික විද්‍යාලයේ තක්සේරු ඩිප්ලෝමා පාඨමාලාවේ, දෙවැනි වර්ෂයේ ශාස්ත්‍රීය පරීක්ෂණය සාර්ථක ලෙස සම්පූර්ණ කොට සිටිය යුතුය,

නැතහොත්

(ii) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලිකරුවන්ගේ ප්‍රමාණ සහ ගිණුම් හා මට්ටම් කිරීම පිළිබඳ ඇවුරුදු සන්ධ්‍යා කාල පාඨමාලාවක් සමග ගොඩනැගිලි නිර්මාණය පිළිබඳ තුන් අවුරු සන්ධ්‍යා කාල පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණකර, ඉහත සඳහන් සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව අගය ප්‍රමාණ කිරීම පිළිබඳ ඇවුරුද්දක ප්‍රායෝගික පළපුරුද්ද ලබා සිටිය යුතුය ;

(ඇ) (ආ) (i) හි සඳහන් සුදුසුකම් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. අගය ප්‍රමාණ කිරීම පිළිබඳ අවශ්‍ය ප්‍රායෝගික පළපුරුද්ද ඇති අයදුම්කරුවන් නැති විටෙක, ප්‍රායෝගික පළපුරුද්ද නැති නමුදු, ඉහත (3) (ආ) (ii) හි සඳහන් කාර්මික සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ද සලකා බලනු ලැබේ. එවැනි අයදුම්කරුවකු පත් කරනු ලැබුවහොත්, පහත සඳහන් වැටුප් පියවරවල් මත තබනු ලැබේ :—

අවුරුදු එකක ප්‍රායෝගික පළපුරුද්ද ඇති අය 1 වෙනි වර්ෂය රු. 4,008, 2 වෙනි වර්ෂය රු. 4,152.

කිසිදු ප්‍රායෝගික පළපුරුද්දක් නැති අය 1 වෙනි වර්ෂය රු. 3,864, 2 වෙනි වර්ෂය රු. 4,008, 3 වෙනි වර්ෂය රු. 4,152.

එසේම ලංකා කාර්මික විද්‍යාලයේ තක්සේරු ඩිප්ලෝමා පාඨමාලාවේ 2 වැනි වර්ෂයේ ශාස්ත්‍රීය පරීක්ෂණයට පෙනී සිටි අයදුම්කරුවන්ට, ප්‍රතිඵල නිකුත් වීම බලාපොරොත්තුවෙන් ඉල්ලුම්කර සිටිය හැක.

5. මේ ගැසට් පත්‍රයෙහි IV වෙනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර, පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙළ කොට, 1975. 04. 15 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා අධ්‍යක්ෂ වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත, අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. යෝග්‍යතා ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ආර්. අබේරත්න,
පළාත් පාලන සේවා අධ්‍යක්ෂ.

පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 530, කොළඹ 1.

2-692—75.02.28 දින අංක 153 දරන ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

## කුරුණෑගල මහ නගර සභාව

### මහ නගර සභා ආඥාපනත

(252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 267 වැනි හා 272 වැනි වගන්ති යටතේ කුරුණෑගල මහ නගර සභාව විසින් සම්පාදිතව, එම ආඥාපනතේ 268 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලදුව, ජාතික රාජ්‍ය සභාව විසින් ස්ථිර කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1975 පෙබරවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

කුරුණෑගල මහ නගර සභාව විසින් සම්පාදිතව, 1972.09.08 වැනි දින අංක 24 දරන ගැසට් පත්‍රයේ පළ වූ නගර ශාලාව පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල දක්වා ඇති උපලේඛනය වෙනුවට පහත දැක්වෙන නව උපලේඛනය ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ :—

### උපලේඛනය

#### කුරුණෑගල මහ නගර සභාවේ නගර ශාලාව පාවිච්චි කිරීම සඳහා අයකිරීම

| | දිනකට රු. ශ. | පැයකට රු. ශ. | අඩුම ගාස්තුව රු. ශ. | ඇප තැන්පත් මුදල රු. ශ. |
|---|---|---|---|---|
| 1. ව්‍යාපාරික අරමුණක් වශයෙන්, දිනකට එක රඟ දැක්වීමක් පමණක් පවත්වනු ලබන ප්‍රසිද්ධ රඟ දැක්වීම් සඳහා ... ... ... ... ... | 250 0 ... | 15 0 ... | 250 0 ... | 100 0 |
| 2. එදිනම නැවත නැවතත් පවත්වනු ලබන එම රඟ දැක්වීමේම එක් එක් වාරය සඳහා ... | 100 0 ... | — ... | — ... | — |
| 3. ව්‍යාපාරික අරමුණක් වශයෙන් නොව, යම්කිසි ආගමික, අධ්‍යාපනික, ත්‍යාගශීලී, සංස්කෘතික හෝ පුණ්‍ය අරමුණක් උදෙසා ප්‍රසිද්ධ රඟ දැක්වීමක් පවත්වන බවට නාගරික කොමසාරිස්වරයා සෑහීමකට පත්වූ කල්හි, එවැනි ප්‍රසිද්ධ රඟ දැක්වීමක් සඳහා ... ... | 150 0 ... | 15 0 ... | 150 0 ... | 50 0 |
| 4. විවාහ මංගල්‍යයක් හෝ වෙනත් පුද්ගලික උත්සවයක් සඳහා ... ... | 150 0 ... | 15 0 ... | 75 0 ... (පැය 6) | 50 0 |
| 5. ව්‍යාපාරික අරමුණක් වශයෙන් නොසැළකෙන සල්පිලක් හෝ සැණකෙළියක් සඳහා ... | 100 0 ... | 15 0 ... | 75 0 ... (පැය 6) | 50 0 |
| 6. ප්‍රසිද්ධ රාත්‍රී භෝජන සංග්‍රහයක්, දිවාභෝජන සංග්‍රහයක් ආදිය හෝ සහභාගිවන්නන් ගෙන් ගාස්තුවක් අයකර පවත්වනු ලබන වෙනයම් සංවිධානාත්මක උත්සවයක් සඳහා ... | 125 0 ... | 15 0 ... | 75 0 ... (පැය 6) | 50 0 |
| 7. නගර ශාලාව වෙන්කරවා ගෙන පවත්වනු ලබන ප්‍රසිද්ධ රඟ දැක්වීමක පූර්ව දර්ශනයක් සඳහා... | — ... | 7 50 ... | 20 0 ... (පැය 3) | — |
| 8. සාකච්ඡා සභාවක්, රැස්වීමක්, දේශණයක්, තෑගි බෙදදීමක්, ආගමික මෙහෙයක්, පුහුණුවීමේ හෝ ඉගෙණීමේ පන්තියක් සඳහා ... ... ... ... | 50 0 ... | 10 0 ... | 20 0 ... (පැය 3) | 25 0 |
| 9. ඉහතින් නිශ්චිතව සඳහන් කරනු නොලැබුවාවූත් යම් ව්‍යාපාරික කාර්යයක් වශයෙන් පවත්වනු ලබන්නාවූත් කුමන අන්දමේ හෝ අරමුණක් සඳහා ... ... ... | 300 0 ... | 20 0 ... | 30 0 ... (පැය 2) | 50 0 |
| 10. ඉහතින් නිශ්චිතව සඳහන් කරනු නොලැබුවාවූත් ව්‍යාපාරික ගණයෙහි ලා නොගැණෙන්නාවූත් යම් කාර්යයක් සඳහා ... ... ... ... ... | 75 0 ... | 10 0 ... | 20 0 ... (පැය 3) | 50 0 |
| 11. කුමන අන්දමේ ප්‍රවේශ ගාස්තුවක් හෝ සහභාගිවීමේ ගාස්තුවක් අය නොකරනු ලබන නාට්‍යයක්, විවිධ ප්‍රසංගයක් හෝ වෙනයම් රඟ දැක්වීමක් නැතහොත් සංවිධානය කරන ලද පිළිගැනීමක් හෝ නැටුමක් සඳහා ... ... ... ... ... | 100 0 ... | 10 0 ... | 50 0 ... (පැය 6) | 50 0 |
| 12. ප්‍රවේශ ගාස්තුවක් අය කරනු ලබන ආලිංගන නැටුමක් සඳහා ... ... | 150 0 ... | 15 0 ... | 75 0 ... (පැය 6) | 50 0 |

2–677–75.02.28 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

---

## කුරුණෑගල මහ නගර සභාව

### මහනගර සභා ආඥාපනත

(252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 267 සහ 272 වන වගන්ති යටතේ කුරුණෑගල මහ නගර සභාව විසින් සම්පාදිතව එකී ආඥාපනතේ 268 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලදුව ජාතික රාජ්‍ය සභාව විසින් ස්ථිර කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1975 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

1. මේ අතුරු ව්‍යවස්ථාවල පද සම්බන්ධයෙන් වෙනත් අර්ථයක් අවශ්‍ය නොවූ විටක, "කොමසාරිස්" යනුවෙන් (252 වන අධිකාරය වන) මහ නගර සභා ආඥාපනත යටතේ පත් කරනු ලැබූ මහ නගර සභා කොමසාරිස් අදහස් වෙයි. තවද,

   "බලපත්‍ර ලත් ස්ථානය" යනුවෙන් මේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍ර ලත් තැනැත්තාට ඌරන් ඇතිකිරීමට හෝ තබා ගැනීමට අවසර දෙන ලද ස්ථානය වෙයි.

2. කොමසාරිස් විසින් ඒ සඳහා නිකුත් කරන ලද වාර්ෂික බලපත්‍ර යක් දරන්නේ නම් මිස, කිසිවෙකු විසින් කුරුණෑගල නගර සභා සීමාව ඇතුළත ඌරන් තබා ගැනීම හෝ ඇති කිරීම නොකළ යුතුය.

3. මේ අතුරු ව්‍යවස්ථා යටතේ වූ සෑම බලපත්‍රයක්ම, මෙහි මීට පසු සඳහන් පරිදි කලින් අවලංගු කරන ලද්දේ නම් මිස, එය නිකුත් කරන ලද වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වලංගු විය යුතුය.

4. මේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද එක් එක් බලපත්‍රයක් සඳහා ඌරන් ඇති කිරීම පිළිබඳව බලපත්‍ර ගාස්තු සභාව විසින් නියම කර ඇති ප්‍රමාණයන් අනුව ගෙවිය යුතුයි.

5. මේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද කිසිම බලපත්‍රයක් වෙනත් කිසිවෙකුට නොපැවරිය යුතුය.

6. යම් ස්ථානයක් සහ එහි පාවිච්චි කිරීමට බලාපොරොත්තු වන ඌරු කොටුව පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව තිබේ නම් මිස නැත් නම් එබඳු ස්ථානයක් සම්බන්ධයෙන් බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය :—

(අ) එකී ස්ථානය කොමසාරිස්වරයා විසින් අනුමත කළ යුතුය.

(ආ) එකී ස්ථානයට ප්‍රමාණවත් ජල පහසුකම් නියමිත අන්දමින් සැපයිය යුතුය ;

(ඇ) එම ස්ථානයේ වතුර බැස යාම පිණිස ප්‍රමාණවත් කාණු සැපයිය යුතුය ;

(ඈ) ඌරු කොටුවේ බිම සිමෙන්තියෙන් හෝ දිය සීරාව උරා නොගන්නා වෙනත් යම්කිසි ද්‍රව්‍යයකින් හෝ සෑදිය යුතු අතර, යටත් පිරිසෙයින් උසින් අඩි තුනකවත් තාප්පයක් බැඳ සිමෙන්තියෙන් කපරාරු කළ යුතුය ;

(ඉ) ඌරු කොටුව යම්කිසි වාසස්ථානයකින් හෝ වීදියකින් අඩි පනහක් පමණ ඈතින් පිහිටුවිය යුතුය ;

(ඊ) ඒ ස්ථානයෙහි තබා ගන්නා ඌරන්ගේ වසුරු, කෑම කුණු හෝ ඌරන් තබා ගැනීමෙන් ඇතිවන වෙනත් අප්‍රසන්න හෝ අප්‍රියදායක දේවල් බහා තැබීම සඳහා මැස්සන් ඇතුළු විය නොහැකි භාජනයක් තැබිය යුතුය.

(උ) ඌරු කොටුව අසළ කුඩා මිදුලක් තිබිය යුතුවාත් හැර ඌරන් අවට සංචාරය කිරීම වළක්වාලීම සඳහා එකී මිදුල අවට කොටු කොට තැබිය යුතුය.

7. බලපත්‍ර ලත් සියලුම ස්ථානයන් ඉර පෑවූ වේලාවේ සිට ඉර බැස යන වේලාව දක්වා අතරතුරු සුදුසු සියලුම අවස්ථාවලදී කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් ලියවිල්ලකින් බලයදී ඇති සභාවේ නිලධාරියෙකු විසින් හෝ පරීක්ෂා කර බලනු ලැබීම නීත්‍යානුකූල විය යුතුය.

8. යම්කිසි බලපත්‍ර ලත් ස්ථානයක් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු කොන්දේසි වලට පටහැනිව තිබෙන අවස්ථාවකදී කොමසාරිස්වරයා විසින් බලපත්‍රධාරියා වෙත භාර දිය යුතු ලිඛිත දැන්වීමකින්, එකී දැන්වීමේ සඳහන් කළ හැකි කොන්දේසි වලට අනුකූලව එකී ස්ථානය පිළියෙල කරන ලෙස කොමසාරිස්වරයා විසින් බලපත්‍රධාරියාට නියම කළ හැකිය.

9. යම්කිසි කරුණක් හේතු කොට ගෙන, 8 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වූ යම්කිසි දැන්වීමක් බලපත්‍රධාරියෙකුට පෞද්ගලිකවම භාර දීමට නොහැකි වන කල්හි, එය ඔහු අවසාන වරට වාසය කළේ යයි දැන ගන්ට ඇති ස්ථානයේ තැබීම හෝ බලපත්‍ර ලත් ස්ථානයේ කාටත් පෙනෙන දෙයක හෝ තැනක අලවා තැබීම එකී දැන්වීම ඔහු වෙත භාර දුන් හැටියට සැලකිය යුතුය.

10. බලපත්‍රධාරියෙකු විසින් තමා වෙත භාර දෙනු ලබන යම්කිසි දැන්වීමක සඳහන් නියමයන්, එකී දැන්වීමේ දැක්වෙන යම් යම් කාල සීමාවල් ඇතුළතදී ද, ඒ සඳහා යම්කිසි කාල සීමාවක් නියම කර නොතිබේ නම්, එකී දැන්වීම භාර දෙනු ලැබීමෙන් දින හතක් ඇතුළතදී ද ඉටු කළ යුතුය.

11. බලපත්‍ර ලත් සෑම කෙනෙකු විසින්ම, බලපත්‍ර ලත් ස්ථානය පිරිසිදුවත් සනීපාරක්ෂානුකූලවත් තබා ගත යුතුය.

12. බලපත්‍ර ලත් සෑම කෙනෙකු විසින්ම, එකී බලපත්‍ර ලත් ස්ථානයේ තබා සිටින ඌරන්ට ලෙඩ රෝගයක් වැළඳුනොත් හෝ මළහොත්, ඒ බව වහාම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා වෙත වාර්තා කළ යුතුය.

13. යම්කිසි ඌරෙකු බලපත්‍ර ලත් ස්ථානයේ යම්කිසි රෝගයක් වැළඳීමෙන් මැරී යන කල්හි බලපත්‍රධාරියා විසින් ඒ බව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා වෙත කලින් දැනුම් නොදී එකී ඌරාගේ මළකුණ වළලා දැමීම හෝ ඌට වෙනත් සුදුස්සක් කිරීම හෝ නොකළ යුතුය.

14. යම්කිසි ඌරෙකු අයිතිකරුවෙකුගේ බලපත්‍ර ලත් ස්ථානයෙන් පිටස්තරව එකී ඌරා දඩාවතේ ඇවිදිනු දක්නට ලැබුණහොත්, ඌ අල්ලා තහනමට ගැනීමට හෝ ගැනීමට සැලැස්වීමට ඒ සඳහා කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන යම් කෙනෙකු විසින් කළ හැකිය.

15. මේ අතුරු ව්‍යවස්ථා වලින් යම්කිසි අතුරු ව්‍යවස්ථාවක් උල්ලංඝනය කරන සෑම අවස්ථාවකදීම රු. 50 කට නොවැඩි දඩයක් ගැසීමෙන් ද, වරදකරු බවට පත් කරනු ලැබීමෙන් පසුව, හෝ එකී උල්ලංඝනය කිරීම පිළිබඳ දැනුම් දෙනු ලැබීමෙන් පසුව එකී වරද දිගටම කරගෙන යනු ලබන සෑම දිනක් සඳහාම රු. 15 කට නොවැඩි අතිරේක දඩයක් ගැසීමෙනුත් දඬුවම් පැමිණ විය හැකිය.

16. මේ අතුරු ව්‍යවස්ථාවලින් යම්කිසි අතුරු ව්‍යවස්ථාවක් උල්ලංඝනය කරනු ලැබීම නිසා උසාවියක් මගින් බලපත්‍රධාරියා දෙවැනි වරට හෝ ඊට පසුව වරදකරුවකු කරනු ලැබීමෙන් එකී උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන්, නීත්‍යානුකූලව පනවනු ලැබිය හැකි වෙනත් යම්කිසි දඬුවමකට යටත් නොවන අන්දමින් එකී අධිකරණය මගින්ම ඔහුගේ බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකිය.

2–768–75.02.28 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

## දේපල විකිණීම

කොළඹ මහ නගර සභාව

හිඟ වරිපනම් සහ ගාස්තු නොගෙවීම නිසා දේපල විකිණීම

පහත දක්වෙන උපලේඛනයේ සඳහන් දේපල වෙනුවෙන් අයවිය යුතු හිඟ වරිපනම් බදු අයකරගැනීමට, තහනම් කිරීම සඳහා චංචල දේපල නොමැති කල්හි මහ නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 252 ඡෙදය ප්‍රකාර, කොළඹ මහ නගර සභාවේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වරෙන්තුවක බලය පිට තහනම් කරන ලද (1) දස වසරක කුලී සහ ලාභ, (2) දාව සහ උපදින ද්‍රව්‍ය (3) ගෙයි උපකරණ සහ (4) පහත සඳහන් දේපලම, ඒ දේපල වෙනුවෙන් ලැබිය යුතු වරිපනම් බදු සහ වරෙන්තු ගාස්තු යථා කාලයේදී ගෙවනු නොලැබුවහොත්, එකී උපලේඛනයෙහි සඳහන් දිනයන්හි පෙරවරු 9 සිට ආරම්භ කොට එකී දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඊ. මහේසන්,
නාගරික කොමසාරිස් වෙනුවට.

කොළඹ මහ නගර සභා කාර්යාලය,
1975 පෙබරවාරි මස 10 වැනිද.

උපලේඛනය

| වරිපනම් අංකය සහ වීථිය | විකුණනු ලබන දිනය | කාලසීමාව (වර්ෂය හා කාර්තුව) |
|---|---|---|
| 72, කිව් පාර ... ... ... | 75.04.17 | ... 1969 ; 1 සිට 1972 ; 4 කාර්. |
| 820/1, මරදාන පාර ... ... ... | 75.04.18 | ... 1971 ; 2 සිට 1973 ; 4 දක්වා |
| 820, මරදාන පාර ... ... ... | 75.04.18 | ... 1971 ; 4 සිට 1973 ; 4 දක්වා |
| 18/6, හැම්ඩන් පටුමග ... ... ... | 75.04.21 | ... 1971 ; 2 සිට 1973 ; 4 දක්වා |
| 18/9, හැම්ඩන් පටුමග ... ... ... | 75.04.21 | ... 1970 ; 1 සිට 1973 ; 4 දක්වා |
| 36/7, පෙරේරා පටුමග ... ... ... | 75.04.21 | ... 1971 ; 4 සිට 1973 ; 4 දක්වා |
| 36/8, පෙරේරා පටුමග ... ... ... | 75.04.21 | ... 1971 ; 4 සිට 1973 ; 4 දක්වා |
| 203, ඩබ්ලිව්. ඒ. සිල්වා මාවත ... ... | 75.04.21 | ... 1973 ; 2 සිට 1973 ; 4 දක්වා |
| 76, කල්‍යාණ පාර ... ... ... | 75.04.21 | ... 1971 ; 4 සිට 1973 ; 4 දක්වා |
| 74, කල්‍යාණ පාර ... ... ... | 75.04.21 | ... 1973 ; 1 සිට 1973 ; 4 දක්වා |
| 305, ගාලු පාර ... ... ... | 75.04.21 | ... 1973 ; 2 සිට 1973 ; 4 දක්වා |
| 301, ගාලු පාර ... ... ... | 75.04.21 | ... 1973 ; 2 සිට 1973 ; 4 දක්වා |

| වරිපනම් අංකය සහ වීථිය | විකුණනු ලබන දිනය | කාලසීමාව (වර්ෂය හා කාර්තුව) |
|---|---|---|
| 658, හැව්ලොක් පාර | 75.04.21 | 1973 ; 1 සිට 1973 ; 4 දක්වා |
| 58/1 සහ 2, හැව්ලොක් පාර | 75.04.21 | 1972 ; 1 සිට 1973 ; 4 දක්වා |
| 3/12, 14, 15 සිට 20, 21, 22, 24, 29, 30, සුවිසුද්ධාරාම පාර | 75.04.21 | 1968 ; 1 සිට 1974 ; 1 දක්වා |
| 3/60, සුවිසුද්ධාරාම පාර | 75.04.21 | 1970 ; 1 සිට 1974 ; 1 දක්වා |
| 63/11, සුවිසුද්ධාරාම පාර | 75.04.21 | 1971 ; 2 සිට 1974 ; 1 දක්වා |
| 71, සුවිසුද්ධාරාම පාර | 75.04.21 | 1970 ; 4 සිට 1974 ; 1 දක්වා |
| 73, සුවිසුද්ධාරාම පාර | 75.04.21 | 1970 ; 1 සිට 1974 ; 1 දක්වා |
| 73/1 සිට 6, සුවිසුද්ධාරාම පාර | 75.04.21 | 1970 ; 1 සිට 1974 ; 1 දක්වා |
| 71/1, 37 වෙනි පටුමග | 75.04.21 | 1970 ; 4 සිට 1974 ; 1 දක්වා |
| 31, සිරිපා පාර | 75.04.22 | 1972 ; 1 සිට 1974 ; 1 දක්වා |
| 30/1–95, ස්කෙල්ටන් උද්‍යානය | 75.04.22 | 1964 ; 1 සිට 1973 ; 2 දක්වා |
| 81/5–8, හැව්ලොක් පාර | 75.04.23 | 1972 ; 2 සිට 1974 ; 1 දක්වා |
| 81/1–5, හැව්ලොක් පාර | 75.04.23 | 1969 ; 3 සිට 1974 ; 1 දක්වා |
| 81/3–4, හැව්ලොක් පාර | 75.04.23 | 1973 ; 1 සිට 1974 ; 1 දක්ටා |
| 81/9–12, හැව්ලොක් පාර | 75.04.23 | 1972 ; 1 සිට 1974 ; 1 දක්වා |
| 87 හැව්ලොක් පාර | 75.04.23 | 1972 ; 4 සිට 1974 ; 1 දක්වා |
| 6, කස්සප පාර | 75.04.23 | 1971 ; 4 සිට 1974 ; 1 දක්වා |
| 6, පෝසප් ප්‍රෙසර් පාර | 75.04.23 | 1972 ; 2 සිට 1974 ; 1 දක්වා |
| 57/1–9ඒ, පිකරින්ස් පාර | 75.04.24 | 1964 ; 3 සිට 1973 ; 4 දක්වා |
| 175/32, පිකරින්ස් පාර | 75.04.24 | 1971 ; 1 සිට 1973 ; 3 දක්වා |
| 144/2/2, පිකරින්ස් පාර | 75.04.24 | 1970 ; 4 සිට 1972 ; 2 දක්වා |
| 144/3, පිකරින්ස් පාර | 75.04.24 | 1972 ; 4 සිට 1973 ; 4 දක්වා |
| 150, පිකරින්ස් පාර | 75.04.24 | 1970 ; 3 සිට 1972 ; 2 දක්වා |
| 175/26, පිකරින්ස් පාර | 75.04.24 | 1971 ; 4 සිට 1973 ; 4 දක්වා |
| 10, ෂූ පාර | 75.04.24 | 1968 ; 3 සිට 1973 ; 4 දක්වා |
| 43/15, 16, 23, 24, බොන්ජින් පාර | 75.04.24 | 1972 ; 1 සිට 1972 ; 4 දක්වා |
| 275/32ඒ, පිකරින්ස් පාර | 75.04.24 | 1971 ; 1 සිට 1973 ; 4 දක්වා |
| 72, මිරානියා වීදිය | 75.04.28 | 1969 ; 1 සිට 1974 ; 1 දක්වා |
| 94, මිරානියා වීදිය | 75.04.28 | 1964 ; 1 සිට 1974 ; 1 දක්වා |
| 70/25–41, පන්සල පාර | 75.04.29 | 1970 ; 4 සිට 1974 ; 2 දක්වා |
| 41, 2 වෙනි මාලිගාකන්ද පටුමග | 75.04.29 | 1968 ; 3 සිට 1974 ; 2 දක්වා |
| 637ඒ, මරදන පාර | 75.04.29 | 1970 ; 4 සිට 1974 ; 2 දක්වා |
| 186, මාලිගාකන්ද පාර | 75.04.29 | 1968 ; 3 සිට 1974 ; 3 දක්වා |
| 428, මාදම්පිටිය පාර | 75.04.30 | 1965 ; 3, 4 සහ 1968 ; 1 සිට 1974 ; 1 දක්වා |
| 444, මාදම්පිටිය පාර | 75.04.30 | 1969 ; 3 සිට 1974 ; 1 දක්වා |
| 470, මාදම්පිටිය පාර | 75.04.30 | 1972 ; 1 සිට 1974 ; 1 දක්වා |
| 758, වේල්ස් කුමාර මාවත | 75,04.30 | 1972 ; 3 සිට 1974 ; 1 දක්වා |
| 79/1–23, ශ්‍රී මහින්ද ධම්ම මාවත | 75.05.02 | 1967 ; 2 සිට 1973 ; 4 දක්වා |
| 161, ආරාමය පෙදෙස | 75.05.02 | 1970 ; 1 සිට 1974 ; 4 දක්වා |
| 11, ශ්‍රී ධර්මාරාම පාර | 75.05.02 | 1973 ; 2 සිට 1974 ; 2 දක්වා |
| 45/30, ඥානවිමල පාර | 75.05.02 | 1972 ; 1 සිට 1974 ; 2 දක්වා |
| 35/1–4, කාමල් පාර | 75.05.05 | 1969 ; 1 වෙනුවෙන් |
| 19/1–4, කාමල් පාර | 75.05.05 | 1971 ; 2, 1972 ; 1, 1973 ; 4 දක්වා |
| 50/1–3, කාමල් පාර | 75.05.05 | 1966 ; 4, 1967 ; 1 සහ 4, 1972 ; 1 1973 ; 4 දක්වා |
| 4, කර්නල් ටී. ජී. ජයවර්ධන මාවත | 75.05.05 | 1972 : 1 සිට 1973 : 4 දක්වා |
| 51, හඩ්සන් පාර | 75.05.05 | 1972 : 3 සිට 1973 : 4 දක්වා |
| 51/1–2, හඩ්සන් පාර | 75.05.05 | 1973 : 2 සිට 1973 : 4 දක්වා |
| 51/3, 5, 6, 8, හඩ්සන් පාර | 75.05.05 | 1973 : 1 සිට 1973 : 4 දක්වා |
| 134, කොල්ලුපිටිය පාර | 75.05.05 | 1966 : 3, 1967 : 1 සිට 1968 : 1 දක්වා |
| 56/2, කොල්ලුපිටිය පාර | 75.05.05 | 1971 : 4, 1972 : 1, 1973 : 3 දක්වා |
| 173, කොල්ලුපිටිය පාර | 75.05.05 | 1967 : 4 සිට 1973 : 4 දක්වා |
| 171/1–5, කොල්ලුපිටිය පාර | 75.05.05 | 1967 : 4 සිට 1973 : 4 දක්වා |
| 134/5–10, කොල්ලුපිටිය පාර | 75.05.05 | 1966 : 2 සිට 1973 : 4 දක්වා |
| 230ඒ, කොල්ලුපිටිය පාර | 75.05.05 | 1967 : 3 සිට 1973 : 4 දක්වා |
| 302, කොල්ලුපිටිය පාර | 75.05.05 | 1968 : 1 සිට 1973 : 3 දක්වා |
| 304, කොල්ලුපිටිය පාර | 75.05.05 | 1967 : 2 සඳහා |
| 55ඒ, ධර්මපාල මාවත | 75.05.05 | 1973 : 1 සිට 1973 : 4 දක්වා |
| 24/1, ධර්මපාල මාවත | 75.05.05 | 1966 : 1 සිට 1973 : 4 දක්වා |
| 6, නෙල්සන් ලේන් | 75.05.05 | 1969 : 2 සිට 1973 : 4 දක්වා |
| 4, නෙල්සන් ලේන් | 75.05.05 | 1971 : 1 සිට 1973 : 4 දක්වා |
| 23, මැනිං පෙදෙස | 75.05.06 | 1971 : 1 සිට 1973 : 4 දක්වා |
| 23/1, මැනිං පෙදෙස | 75.05.06 | 1969 : 3 සිට 1973 : 4 දක්වා |
| 25, මැනිං පෙදෙස | 75.05.06 | 1971 : 1 සිට 1973 : 4 දක්වා |
| 27, මැනිං පෙදෙස | 75.05.06 | 1971 ; 1 සිට 1973 : 4 දක්වා |
| 29, මැනිං පෙදෙස | 75.05.06 | 1971 : 1 සිට 1973 : 4 දක්වා |
| 31, මැනිං පෙදෙස | 75.05 06 | 1971 : 1 සිට 1973 : 4 දක්වා |
| 33, මැනිං පෙදෙස | 75.05.06 | 1971 : 1 සිට 1973 : 4 දක්වා |
| 35, මැනිං පෙදෙස | 75.05.06 | 1971 : 1 සිට 1973 : 4 දක්වා |
| 37, මැනිං පෙදෙස | 75.05.06 | 1971 : 1 සිට 1973 : 4 දූක්වා |
| 37ඒ, මැනිං පෙදෙස | 75.05.06 | 1969 ; 3 සිට 1973 : 4 දක්වා |
| 44, හාර්මර්ස් ඇවනිව් | 75.05.06 | 1969 : 2 සිට 1973 : 4 දක්වා |
| 46, හාර්මර්ස් ඇවනිව් | 75.05.06 | 1969 : 3 සිට 1973 : 4 දක්වා |

| වරිපනම් අංකය සහ වීථිය | විකුණනු ලබන දිනය | කාලසීමාව (වර්ෂය හා කාර්තුව) |
|---|---|---|
| 46/1, හාර්මර්ස් ඇවනිව ... ... ... | 75.05.06 | ... 1969 : 1 සිට 1973 : 4 දක්වා |
| 387, හැව්ලොක් පාර ... ... ... | 75.05.06 | ... 1968 : 1 සිට 1973 : 4 දක්වා |
| 70, මායා මාවත ... ... ... | 75.05.06 | ... 1967 : 4 සිට 1973 : 4 දක්වා |
| 53/9, ඩබ්ලිව්. ඒ. සිල්වා මාවත ... ... ... | 75.05.06 | ... 1968 : 1 සිට 1973 : 4 දක්වා |
| 2, සිරිල් සී. පෙරේරා මාවත ... ... ... | 75.05.07 | ... 1972 : 1 සිට 1974 : 2 දක්වා |
| 14, සිරිල් සී. පෙරේරා මාවත ... ... ... | 75.05.07 | ... 1973 : 2 සිට 1974 : 2 දක්වා |
| 32, සිරිල් සී. පෙරේරා මාවත ... ... ... | 75.05.07 | ... 1973 : 1 සිට 1974 : 2 දක්වා |
| 46/1ඒ, සිරිල් සී. පෙරේරා මාවත ... ... | 75.05.07 | ... 1972 : 3 සිට 1974 : 2 දක්වා |
| 46/1බී, සිරිල් සී. පෙරේරා මාවත ... ... | 75.05.07 | ... 1971 : 4 සිට 1974 : 2 දක්වා |
| 96ඒ, සිරිල් සී. පෙරේරා මාවත ... ... ... | 75.05.07 | ... 1971 : 4 සිට 1974 : 2 දක්වා |
| 98, සිරිල් සී. පෙරේරා මාවත ... ... ... | 75.05 07 | ... 1971 : 3 සිට 1974 : 2 දක්වා |
| 20, මේෆිල්ඩ් පටුමග ... ... ... | 75.05.07 | ... 1972 : 2 සිට 1974 : 2 දක්වා |
| 78/9, 12, 14 සහ 15 මේෆිල්ඩ් පටුමග ... ... | 75.05.07 | ... 1971 : 1 සිට 1974 : 2 දක්වා |
| 139/1, 24, 25 මේෆිල්ඩ් පටුමග ... ... ... | 75.05.07 | ... 1972 : 3 සිට 1974 : 2 දක්වා |
| 104, වාසල පාර ... ... ... | 75.05.07 | ... 1972 : 4 සිට 1974 : 2 දක්වා |

2–689–75.02.28 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

**මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව පල්ලේගම්පහ දකුණ ගම් සභාව**

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි නම් සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානයෙහි 1975 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම් කර ඇති බැවින් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන හා. ප. පල්ලේගම්පහ දකුණ ගම් ප්‍රදේශයේ තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේනම්, එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුක්ත ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවිය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වෙනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

**උපලේඛනය**

| අංකය | ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1 | ... අබ්දුල් කපූර් මොහමඩ් සරීප් ... | එළහරක් මස් විකිණීම ... | පොල්වත්ත, බුලුකොහොකුන්න, අකුරණ |

1975ක්වූ පෙබරවාරි මස 11 දින,
හා. ප. පල්ලේගම්පහ දකුණ ගම්සභා කාර්යාලය
වැකඩහදිරම, බටුගොඩ.

පී. ඇන්. ඇම්. රෂීඩ්,
ගම්සභාපති, හා. ප. පල්ලේගම්පහ දකුණ.

2—672–75.02.28 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

---

**කළුතර බද්ද ගම්සභාව**

**ගෝඝාතක ආඥාපනත**

මෙහි පහත උපලේඛනයේ සඳහන් අයවලුන් විසින් ඒ අයවලුන්ගේ නම් ඉදිරියෙහි විස්තරව සඳහන් වන ස්ථානයන්හි මස් විකිණීමෙන් ගෝඝාතක ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන කළුතර බද්ද ගම්සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ මතයයි දක්වෙන පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත එවිය හැකි ලෙසත්, (272 වන අධිකාරය) ගෝඝාතක ආඥාපනතේ 7 (2) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | අංකය හා ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| බී. ඇම්. ඇස්. හුසේන්, 38, ගුඩ්ෂෙඩ් පාර, කළුතර දකුණ ... | ගම්සභාවේ පාලනයට යටත් කලමුල්ලේ පිහිටි කඩපිල ... | ගවමස් |
| බී. ඇම්. ඇස්. හුසේන්, 38, ගුඩ්ෂෙඩ් පාර, කළුතර දකුණ ... | නාගොඩ, මරදන කුරුදුවත්ත නමැති ඉඩමේ පිහිටි කඩපිල ... | ගවමස් |

ඩී. ලුවිස් සිල්වා,
සභාපති,
කළුතර බද්ද ගම්සභාව.

වර්ෂ 1975 ක්වූ පෙබරවාරි මස 11 වැනි දින,
බෝම්බුවල, නාගොඩ,
කළුතර බද්ද ගම්සභා කාර්යාලයේදීය.

2–673—75.02.28 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

රම්බොඩ ගම් සභාව

ගෝඝාතක ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් සඳහන් ස්ථානයෙහි මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන රම්බොඩ ගම්සභා සීමාව තුල පදිංචි ඕනෑම කෙනෙකුට තම ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු මතයයි දක්වෙන පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින දහහතරක් ඇතුලත මා වෙත එවන මෙන් ඉල්ලා සිටින බවත්, ගෝඝාතක ආඥාපනතේ (272 වන අධිකාරය) 7 (2) වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම් කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ඇම්. කාදර් ඉබ්‍රාහිම් | කටුකිතුල පොදු වෙළඳ පොල අංක 4 දරණ කාමරය | එළහරක් මස් |

ඇම්. විජේතුංග,
රම්බොඩ ගම් සභාවේ සභාපති.

රම්බොඩ ගම්සභා කාර්යාලය,
කටුකිතුල, 1975.02.13

2–671–75.02.23 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

---

වරකාගොඩ පළාත ගම් සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය ඒ ඉදිරියෙන් දක්වා ඇති ස්ථානයන්හි 1975 වර්ෂය තුළ මස් විකිණීමට ගෝඝාතක බල පත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බල පත්‍රය නිකුත් කිරීමට විරුද්ධ වරකාගොඩ පළාත ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු සඳහායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින හතක් (7ක්) ඇතුළත මා වෙත එවිය යුතු බව ගෝඝාතන ආඥාපනතේ 272 වන අධිකාරයේ අංක 7(2) දරණ වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

හර්මන් කන්නන්ගර,
සභාපති, වරකාගොඩ පළාත ගම් සභාව.

උප ලේඛනය

| ඉල්ලුම් කරුගේ නම හා ලිපිනය | වෙළඳාමේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| ඒ. එම්. පී. අබ්දුල් කාසිම් මහතා ... | එළ හරක් මස් ... | උයන්වත්ත ඉඩම, වරකාගොඩ |

2–711–75.02.28 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

---

නාත්තන්ඩිය සුළු නගර සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය ඊට ඉදිරියෙන් ඇති ස්ථානයේ 1975 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම් කොට තිබෙන බව, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන නාත්තන්ඩිය සුළු නගර සභා සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් සිය විරුද්ධතාවය සඳහා ඇති කරුණු සඳහන් කොට, පිටපත් දෙකකින් යුක්තවූ ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බැව් මෙයින් දනුම් දෙමි.

උප ලේඛනය

| ඉල්ලුම් කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| ඩබ්ලිව්. මාකුස් කමෙල්, මාරාවිල ... | සුළු නගර සභාවට අයත් අඹගහවාඩිය පාරේ පිහිටි ඉඩම—ඌරු මස් |

ඩබ්ලිව්. ඊ. ප්‍රනාන්දු,
පාලන නිලධාරී,
නාත්තන්ඩිය සුළු නගර සභාව.

1975. 02. දින,
නාත්තන්ඩිය සුළු නගර සභා කාර්යාලයේදීය.

2–712–75.02.28 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

---

වාද්දුව සුළු නගර සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උප ලේඛණයෙහි සඳහන් අය විසින් 1975 වර්ෂයේදී මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම්කර සිටින බවත්, ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම ගැන වාද්දුව සුළු නගර සභා ප්‍රාදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක්, මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, එම මස් මරන්නන් පිළිබඳ ආඥා පනතේ (272 වැනි අධිකාරියේ) අංක 7 දරණ වගන්තියේ ප්‍රකාර මෙයින් දනුම් දෙනු ලැබේ.

උප ලේඛනය

| ඉල්ලුම් කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඇම්.සී. ඇම්. හුසේන් මහතා, 38, මරික්කාර් වීදිය, කළුතර දකුණ ... | එල හරක් මස් ... | වාද්දුව පොදු වෙළඳපොළ ගව මස් කඩය |

ඇම්. ඩී. ඒ. ගුණතිලක,
සභාපති,
සුළු නගර සභාව, වාද්දුව.

75.02.07 දින,
වාද්දුව සුළු නගර සභා කර්යාලයේදී ය.

2–713–75.02.28 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

## රත්නපුර මහ නගර සභාව

(252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනත

මහ නගර සභා ආඥාපනතේ 305 (1) වැනි ඡේදය යටතේ 1974 මාර්තු මස 08 වැනි දින අංක 102 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද උපලේඛනයේ දක්වා ඇති කර්මාන්ත සහ ව්‍යාපාරයන්ගෙන් පහත උපලේඛනයේ දක්වා ඇති කර්මාන්ත සහ ව්‍යාපාරයන් ඉදිරියේ දක්වා ඇති නියමිත බලපත්‍ර ගාස්තු ප්‍රමාණයන් පමණක්, 1975 ජනවාරි මස 01 වැනි දින සිට රත්නපුර මහ නගර සභාව මගින් සංශෝධනය කර ඇති බවත්, අනෙකුත් බලපත්‍ර ගාස්තු ප්‍රමාණයන් ඉහතකී නිවේදනයේ සඳහන් පරිදිම බලපවත්වනු ලබන බවත්, යථෝක්ත ආඥාපනතේ 305 (1) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

උපාලි රාජපක්ෂ,
නගරාධිපති, රත්නපුර.

1975 පෙබරවාරි 09 වැනි දින,
රත්නපුර,
මහ නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | වාර්ෂික බලපත්‍ර ගාස්තුව | |
|---|---|---|
| | රු. | ශ. |
| (1) ලියවන පට්ටලයක් සහිත ගරාජ් එකක් පවත්වාගෙන යාම ... ... | 250 | 0 |
| (2) තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම ... | 30 | 0 |
| (3) කරණවෑම්හලක් පවත්වාගෙන යාම ... | 50 | 0 |
| (4) ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම ... | 25 | 0 |
| (5) දර ගබඩාවක් පවත්වාගෙන යාම ... | 15 | 0 |
| (6) ලී ගබඩාවක් පවත්වාගෙන යාම ... | 200 | 0 |
| (7) වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම ... | 25 | 0 |
| (8) තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම ... | 750 | 0 |
| (9) මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් සහිත පැට්‍රල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම ... ... | 200 | 0 |
| (10) ඇඹරුම්හලක් පවත්වාගෙන යාම ... | 75 | 0 |
| (11) ගෝනි ගබඩා කර තබා ගැනීම ... | 100 | 0 |
| (12) උළු හෝ ගඩොල් නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම ... ... ... | 75 | 0 |
| (13) වයින් ස්ප්‍රීට් ගබඩා කර තබා ගැනීම ... | 25 | 0 |
| (14) අයිස්ක්‍රීම් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම ... ... ... | 50 | 0 |
| (15) දුව භාණ්ඩ සඳහා ස්ථානයක් හෝ දුව ගබඩා කර පවත්වාගෙන යෑම ... ... | 150 | 0 |
| (16) මිනී පෙට්ටි සෑදීම හා වෙළඳාම සඳහා ගබඩා කර තැබීම ... ... ... | 150 | 0 |
| (17) ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම ... | 75 | 0 |
| (18) පුද්ගලික මාළු කඩයක් පවත්වාගෙන යාම ... | 350 | 0 |
| (19) ලැගුම්හලක් පවත්වාගෙන යාම ... ... | 100 | 0 |
| (20) යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ලී මෝලක් පවත්වාගෙන යාම ... ... | 300 | 0 |
| (21) යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ගල් මෝලක් පවත්වාගෙන යාම ... ... | 350 | 0 |
| (22) ඊයම් බැටරි නැවත චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන ... ... | 50 | 0 |
| (23) රබර් ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම ... ... ... | 150 | 0 |
| (24) පුද්ගලික මස් කඩයක් පවත්වාගෙන යාම ... | 500 | 0 |

2-709—75.02.28 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

---

## බලන්ගොඩ නගරය

1975 වර්ෂයේ වරිපනම් බදු ලේඛන

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 166 වැනි වගන්තියේ (252 වැනි අධිකාරය) මහ නගර සභා ආඥාපනතේ 235 (1) දරණ වගන්තිය සමග කියැවෙන පරිදි 1975 වර්ෂය සඳහා බලන්ගොඩ නගරයේ වරිපනම් බදු ලේඛන දැනට සූදානම්ව ඇති බැවින්, එම ලේඛන නියමිත කාර්යාල වේලාවන් තුළදී මෙම කාර්යාලයේ දී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ඩී. සිබට්,
විශේෂ කොමසාරිස්,
බලන්ගොඩ නගරය.

1975. 2. 11 වෙනි දින,
බලන්ගොඩ නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

2-716—75.02.28 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

---

## මාගම්පුර ගම්සභාව

ගම්සභා ආඥාපනත—257 වැනි අධිකාරය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම්පුර ගම්සභාවේ පරිපාලන නිලධාරි වන මා විසින් පහත සඳහන් තීරණය ගත් බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කර සිටිනු ලැබේ. එහි දැක්වෙන පාරවල් සම්බන්ධයෙන් ඉඩම් හිමියන්ගේ හෝ ප්‍රදේශවාසීන්ගේ හෝ යම් විරුද්ධතාවයක් ඇත්නම් ඒ කුමන හේතුවක් හෝ හේතූන් නිසාදැයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළකරණ ලද දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. එකී නියමිත වකවානුව තුළ එවැනි විරුද්ධතාවයන් නොදක්වුවහොත් ඉන්පසු එම පාරවල් ගැසට් පත්‍රයෙහි පළකර ඇති අන්දමට එය ඉදිරියෙන් ඇති දිග පළල අනුව ගම්සභාව සතු දේපලක් ලෙස සළකා සාදවා හෝ නැවත සාදවා පවත්වාගෙන යන බවද මෙයින් දන්වනු ලැබේ.

තීරණය :—

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා පොදු අතුරු ව්‍යවස්ථා ආඥාපනතේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ, තිස්සමහාරාම මාගම්පුර ගම් ප්‍රදේශයේ පරිපාලන නිලධාරි ඒ. ඇල්. ඇම්. රෂීන් වන මා විසින් 1959 ජනවාරි මස 2 වැනි දින අංක 11,633 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකරණ ලද යෝජනාවෙන් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවන්හි 4 වැනි කාණ්ඩයේ 1 වැනි වගන්තියේ ප්‍රකාර 1969 ජූලි මස 11 වැනි දින අංක 14,862 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ද, 1970 නොවැම්බර් මස 5 වැනි දින අංක 14,931 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ද, පළකරණ ලද පාරවල් ලැයිස්තුවලට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන මංමාවත් ඒ ඒ මංමාවත් ඉදිරියේ සඳහන් දිග පළල ඇතිව සාද හෝ නැවත සාද පවත්වාගෙන යා යුතු බවට තීරණය කරමි.

| පාරේ නම | | දිග | | | | පළල |
|---|---|---|---|---|---|---|
| | | හැ. | ද. | අඩි. | | අඩි |
| 45. ගැමුණුපුර ඇල්ලගල පාර | ... | 2 | 53 | 62 | ... | 22 |
| 46. වලෝඉඩම හරස් පාර | ... | — | 16 | 44 | ... | 16 |

ඒ. ඇල්. ඇම්. රෂීන්,
පරිපාලන නිලධාරි,
මාගම්පුර ගම්සභාව.

1975 පෙබරවාරි මස 10 දින,
තිස්සමහාරාම, මාගම්පුර පාලන නිලධාරි කාර්යාලයේ දීය.

2-721—75.02.28 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

---

## ජල භීතිකා රෝගය

පොල්ගහවෙල සුළු නගර සභාව

පොල්ගහවෙල සුළු නගර සීමාව තුළ ජල භීතිකා රෝග උවදුර පවතින බැවින් එම නගර සභා සීමාව තුළ ඒහිපිට පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඬුවකේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසි යම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයකු විසින් එවෙලේම විනාශ කරනු ලබන බව ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 176 වෙනි පරිච්ඡේදය වන ජලභීතිකා ආඥාපනතේ 1 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශනය කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය ගැසට්පත්‍රයේ පළවන දින සිට හය මාසයක කාලයක් බලපවත්වනවා ඇත.

ඩබ්ලිව්. ගාමිණී ද සිල්වා,
සභාපති,
සුළු නගර සභාව, පොල්ගහවෙල.

සුළු නගර සභා කාර්යාලය,
පොල්ගහවෙල,
1975. 02. 11.

2-730—75.02.28 දින අංක 153 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රය පළ කිරීම සඳහා නිවේදන භාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන් අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වෙනවාත් හැර සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1975

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| පෙබරවාරි | 07.02.75 | සිකුරාද | 31.01.75 | සිකුරාද | දවල් 12.00 |
| | 14.02.75 | සිකුරාද | 07.02.75 | සිකුරාද | දවල් 12.00 |
| | 21.02.75 | සිකුරාද | 14.02.75 | සිකුරාද | දවල් 12.00 |
| | 28.02.75 | සිකුරාද | 21.02.75 | සිකුරාද | දවල් 12.00 |
| මාර්තු | 07.03.75 | සිකුරාද | 28.02.75 | සිකුරාද | දවල් 12.00 |
| | 14.03.75 | සිකුරාද | 07.03.75 | සිකුරාද | දවල් 12.00 |
| | 21.03.75 | සිකුරාද | 14.03.75 | සිකුරාද | දවල් 12.00 |
| | 27.03.75 | බ්‍රහස්පතින්ද | 21.03.75 | සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් | 04.04.75 | සිකුරාද | 27.03.75 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 11.04.75 | සිකුරාද | 04.04.75 | සිකුරාද | දවල් 12.00 |
| | 18.04.75 | සිකුරාද | 11.04.75 | සිකුරාද | දවල් 12.00 |
| | 24.04.75 | බ්‍රහස්පතින්ද | 18.04.75 | සිකුරාද | දවල් 12.00 |
| මැයි | 02.05.75 | සිකුරාද | 24.04.75 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 09.05.75 | සිකුරාද | 02.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 16.05.75 | සිකුරාද | 09.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 23.05.75 | සිකුරාද | 16.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 30.05.75 | සිකුරාද | 23.05.75 | සිකුරාද | දවල් 12.00 |
| ජූනි | 06.06.75 | සිකුරාද | 30.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 13.06.75 | සිකුරාද | 06.06.75 | සිකුරාද | දවල් 12.00 |
| | 20.06.75 | සිකුරාද | 13.06.75 | සිකුරාද | දවල් 12.00 |
| | 27.06.75 | සිකුරාද | 20.06.75 | සිකුරාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී